**ශීර්ෂය - 435 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ප්‍රකාශය කරමි.

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ ස්ථාපිත කර තිබුණු අමාත්‍යාංශයක් වන බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කල නොහැකි අතර ඉකුත් වර්ෂය සඳහා මා විසින් කිසිදු නිර්දේශයක් නිකුත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවැති අමාත්‍යාංශයක වැය විෂයයන් 17 ක් යටතේ වියදම් සිදු කර තිබුණු එකතුව රු.මිලියන 1,802 ක වියදම විධිවිධාන ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ වැය විෂයන් 29 ක් සඳහා ප්‍රතිපාදනය සලසා තිබූ රු.6,203,026,000 කින් එකතුව රු.1,270,318,918ක් වූ වැය විෂයන් 19 ක ප්‍රතිපාදන සියයට 23 සිට 100 ක් දක්වා පරාසයකින් ඌන උපයෝජිතව පැවති අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 20ක් විය. ඉහත වැය විෂයන් අතුරින් මු.රෙ.66 මාරු කිරීම්ද ඇතුලත්ව සියයට 50 ක් ඉක්මවා ප්‍රතිපාදන ඉතිරි වී තිබූ වැය විෂයන් 16 ක් පැවතුණි. | කොරෝනා වසංගත පැවති තත්වය නිසා පුනරාවර්තන වියදම් ඉතිරි වී ඇත. | ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | වැය විෂයය අංක 2012 සඳහා පරිපූරක ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය වූ රු.3,350,000කින් රු.1,129.291 ක් හෙවත් සියයට 34 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | කොරෝනා වසංගත තත්වය නිසා බොහෝ ආයතනවල උපකරණ හිගයන් පැවති නිසා මෙය ඉටු කරලීමට නොහැකි විය. | -එම- |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756(6) | 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණන දිනය වූ 2020 අප්‍රේල් 08 දින වන විටත් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනැති අංක.බීඩී/ඒඒ/එල්ආර්/01/2021 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපිය. | විසර්ජන පනත මගින් අනුමත කර තිබූ අවම ලැබීම් සීමාව රු.1,000,000 ක්වුවද, එම සීමාව 2020 දෙසැම්බර් 31 දින රු.200,000ක් ලෙස සංශෝධනය කර තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශනය සංශෝධිත සීමාවන් ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ සංශෝධන දැනුම් දීම ප්‍රමාද වීම නිසා විසර්ජන ගිණුමට ඇතුලත් කිරීමට නොහැකි විය. | සංශෝධිත සීමාවන් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව බැර ශේෂවල එකතුව රු.219,703 ක් වුවද සැසඳුම් ප්‍රකාශනය අනුව එම ශේෂය රු.231,477 ක් වුයෙන් එම ශේෂ දෙක අතර රු.11,774ක වෙනසක් විය. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | කේවළ ශේෂ සාරාංශයේ අනුව ශේෂය හා සැසඳුම් ප්‍රකාශ අනුව ශේෂය සමාන විය යුතුය. |

**2.5 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.812,157ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි. | පිළිගනිමි. | ගිණුම් වර්ෂය අවසාන දිනට පැවති සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කල යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර තිබූ පාලම් සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 09ක් වෙනුවෙන් රු. මිලියන 17.97ක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද පාලම් ව්‍යාපෘතීන් 06ක් පමණක් රු.මිලියන 5.53ක් වියදම් දරා ඉදිකිරීමට ආරම්භ කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 33 සිට සියයට 41 ක පරාසයක පැවතිනි. | පිළිගනිමි. | සැලසුම් කල කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කඩිනමින් නිම කිරිමට කටයුතු කල යුතු වීම. |
| (ආ) ග්‍රාමීය පාලම් සංවර්ධනය යටතේ 2020 වර්ෂයේදී දිස්ත්‍රික්ක 12 ක ව්‍යාපෘති 53 ක් වෙනුවෙන් රු.මිලියන 813.52 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 278.90 ක් හෙවත් සියයට 34 ක් පමණක් වැය කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා අනුව ග්‍රාමීය පාලම් ව්‍යාපෘති 59 ක් හඳුනාගෙන ඉන් පාලම් 36ක කොන්ත්‍රාත් ප්‍රදානය පමණක් කර තිබුණි. මින් ව්‍යාපෘති 13 ක ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | පිළිගනිමි. | සැලසුම් කල කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කඩිනමින් නිම කිරිමට කටයුතු කල යුතු වීම. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාලම් 100 ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය අමාත්‍යාංශය මඟින් ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වෙත ලබා දී ඒ සඳහා රු.මිලියන 30 ක අත්තිකාරම් 2020 දෙසැම්බර් 31 ගෙවා තිබුණද 2021 මාර්තු 31 දිනට ඉදිරිපත්කර තිබූ ප්‍රගති වාර්තාව අනුව පාලම් 11 ක් පමණක් වැඩ ඉටුකරමින් පැවතුණි. ඒ සඳහා මුලු අත්තිකාරම් මුදලින් රු. මිලියන 8ක් හෙවත් සියයට 27ක් පමණක් වැයකර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 4.5ක් තරම් පහල මට්ටමක පැවතුනි. | මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කල ප්‍රතිපාදන නොලැබුණ නිසා සැලසුම් කල පරිදි ව්‍යාපෘති ආරම්භ කිරිමට නොහැකි විය. 2021 ආරම්භ කරන ලද පාලම් ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය නිර්මාණ හා සංවර්ධන නීතිගත සංස්ථාව වෙත ලබා දුන් අත්තිකාරම් මුදල හිලව් කර ඇත. | කොන්ත්‍රාත් කාලය තුල ව්‍යාපෘති නිම කරවා ගැනිම සඳහා අවදානය යොමු කල යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් අමාත්‍යාංශය මගින් ග්‍රාමීය මාර්ග අංශයට අදාලව තිරසර සංවර්ධන අරමුණු තුනක් හඳුනාගෙන තිබුණද 2020 අවසන් කාර්තුව තුල ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කිරීම හේතුවෙන් එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාල වැඩ සැලසුම් පිළියෙල කර නොතිබුණි. | 2021 වාර්ෂික වැඩ සැලැස්ම සකස් කිරීමේදි තිරසාර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් වැඩ සටහන් සැලසුම් කර ඇත. | හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිමට අදාල පියවර ගත යුතු වීම. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය සඳහා 2021 අප්‍රේල් 27 දින දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබූ බැවින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගනිමි. අභ්‍යන්තර විගණකවරයෙකු ඉල්ලා ඇතත් මේ වන තෙක් පත් කර නොමැත. | අභ්‍යන්තර විගණනයක් සිදු කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**5.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අප්‍රේල් 27 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් පවත්වා නොතිබුණි. | පිළිගනිමි. | විගණන පනත ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා එහි සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත තනතුරු 50ක් පැවති අතර ඉන් පිළිවෙලින් ජේෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක, ද්විතීක මට්ටමේ තනතුරු 10ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07ක පුරප්පාඩු පැවතිණි. | පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් කර ඇත. . | අවශ්‍යතාව අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම. |